# බීජ, බුද්ධිමය දේපල අයිතිය සහ තුන්වන ලෝකය

ආචාර්ය ඩබ්. යූ. කේ. රාජපක්ෂ
*පර්යේෂණ සහ පුහුණු කිරීමේ නිළධාරී*
*ගොවිකටයුතු පර්යේෂණ සහ පුහුණු කිරීමේ ආයතනය*

**ලොව වෙළඳ කටයුතු රාජ්‍ය මැදිහත් වීමකින් තොර ව නිදහසේ පවත්වාගෙන යාම වෙළඳ සහ තීරු බදු පිළිබඳ පොදු සම්මුතියේ (General Agreement on Trade and Tariff) උරුගුවේ වටයේ සාකච්ඡාවල මුඛ්‍ය පරමාර්ථයයි. මෙම සාකච්ඡාවන්ට යොමු වී ඇති ප්‍රධාන මාතෘකා අතර. බුද්ධිමය දේපල අයිතිය (Intellectual Property) සංරක්ෂණය කිරීම ද වේ.**

බුද්ධිමය දේපල යටතේ යම් නිර්මාණයක, තාක්ෂණයක එසේත් නැතහොත් නිෂ්පාදනයක අයිතිය එහි නිෂ්පාදකයාට හෝ නිෂ්පාදනය කරන සමාගමට හෝ හිමි වෙනු ඇත. එම අයිතිය නිෂ්පාදකයාට පේටන්ට් අයිතිය (Patent right) ලෙස හෝ කතෘ භාගය (Copy right) ලෙස හෝ වෙළඳ ලකුණු (Trade Mark) ලෙස හෝ ප්‍රදානය කෙරේ. බුද්ධිමය දේපල අයිතිය යටතේ එම නිෂ්පාදනය හෝ තාක්ෂණය උපයෝගී කර ගැනීම වෙනුවෙන් යම් ගෙවීමක් සිදු කිරීමට එය භාවිතා කරන්නන්හට සිදු වේ.

නව ශාක සහ සත්ත්ව ප්‍රභේද, ශාඛ සහ සත්ත්ව නිෂ්පාදනයේ ජීව විද්‍යාත්මක ක්‍රියාවලීන් පවා ඒවායේ නිර්මාතෘන්ගේ බුද්ධිමය දේපල සේ සලකා සංරක්ෂණය කළ යුතු ය යන්න වෙළඳ සහ තීරුබදු පිළිබඳ පොදු සම්මුතියේ උරුගුවේ වටයේ සාකච්ඡා වලට ඇමරිකා එක්සත් ජනපදය සහ ජපානය ඉදිරිපත් කර ඇති යෝජනා වල සඳහන් වෙයි. එසේම සංවර්ධිත රටවල ක්‍රියාත්මක වන බුද්ධිමය දේපල අයිතිය සෑම රටකටම පොදු වන සේ ක්‍රියාත්මක කළ යුතු යයි ද, එහි පරිපාලන කටයුතු වෙළඳ සහ තීරුබදු පිළිබඳ පොදු ගිවිසුම විසින් මෙහෙය විය යුතු බැව් ද, සංවර්ධිත රටවල් යෝජනා කරයි.

නව ශාඛ සහ සත්ත්ව ප්‍රභේද පෞද්ගලික අයිතිට පවරා දීමෙන් සහ ඒ අයිතීන් ආරක්ෂා කර දීමට වෙළඳ සහ තීරුබදු පිළිබඳ පොදු සම්මුතිය ඉදිරිපත් වීමෙන් ඇති විය හැකි අයහපත් ප්‍රතිඵල කෙරෙහි විරෝධතා දැනටමත් පැනනැගී ඇති අතර බහු ජාතික බීජ සමාගමක් වන බැංගලෝරයේ Tropical Seed India (Pvt) සමාගමට පසුගිය ද පහර දීම ගොවීන්ගේ විරෝධය එළිබට එක් අවස්ථාවකි.

නව ශාඛ ප්‍රභේද ඒවායේ නිර්මාතෘන්ගේ බුද්ධිමය දේපල සේ සංරක්ෂණය කිරීම තුලින් ආහාර නිෂ්පානයේ මූලික යෙදවුමක් වන බීජ පෞද්ගලික අයිතියට නතු වුවහොත් එයදියුණු වෙමින් පවත්නා රටවල් කෙරෙහි බල පෑ හැක්කේ කෙසේ දැයි මෙහි දී සාකච්ඡා කරමු.

මේ අතරින් ඉතාම වැදගත් වනුයේ ප්‍රාග්ධනය, තාක්ෂණය සහ සම්පත් අතින් සංවර්ධිත රටවලට වඩා ගව් ගණනක් පිටු පසින් සිටින්නා වූ තුන්වන ලෝකයේ රටවලට, නව ප්‍රභේද නිෂ්පාදනයට සහ බුද්ධිමය දේපල අයිතිය සඳහා ඉදිරිපත්වීමේ ඇති හැකියාව අඩු නිසා ඇති විය හැකි අසාධාරණය යි. වැටි වැටි ඇවිදින කුඩා ළදරුවකු කාල් ලුවිස් සමග ධාවන තරඟයකට යෙදවීම කොපමණ දුරට සාධාරණ වේද? සියවස් ගණනක් මුළුල්ලේ අප රටවල් සූරා කෑම තුලින් සංවර්ධිත රටවල් උපයා ගත් ප්‍රාග්ධනය, සම්පත් සහ තාක්ෂණය උපයෝගී කොට නව දුරටත් අප සූරා කෑමට ය,ඔවුන් සැරසෙන්නේ.

කෘෂි ක්ෂේත්‍රයේ නියැලී සිටින බහු ජාතික සමාගම් දැනටමත් සියලු කෘෂි රසායනික ද්‍රව්‍ය පොහොර නිෂ්පාදනයේත්, ඒවා අලෙවියේත් ඒකාධිකාරය දියුනු වෙමින් පවත්නා රටවල පතුරවමින් සිටිති. මෙයට අමතර ව තමන් පෞද්ගලික අයිතියට පවරාගත් අභිජනනයෙන් ලබා ගන්නා ලද නව ශාඛ ප්‍රභේද අලෙවියටත්, එම ප්‍රභේදයන් සඳහා විශේෂයෙන් පිළියෙල කරණ ලද, රසායනික ද්‍රව්‍ය නිෂ්පාදනයටත් අවතීර්ණ වුවහොත් එහි ප්‍රතිඵලය ඉතා භයානක විය හැක්කේ, දියුණු වෙමින් පවත්නා රටවල කෘෂිකර්මයේ සුක්කානම ඔවුන් අතට පත් වන බැවිනි. මිලයට ගන්නා ලද නව ශාඛ ප්‍රභේද වල බීජ ගොවීන් විසින් ගුණනය කර ඊළඟ වසර වල බීජ ලෙසින් පරිහරණය කිරීමේ දී බුද්ධිමය දේපල අයිතිය ලෙස ඒවා නිර්මාණය කරන ලද අභිජනකයාට දිගින් දිගටම ගෙවීමක් සිදු කිරීමට වීමත්, එමගින් දියුණු වෙමින් පවත්නා රටවල් සදාකාලික වහලුන් බවට පත්වීමත් නො වැලැක්විය හැක්කේ ය.

තුන්වන ලෝකය තුළ,බීජ ක්ෂේත්‍රයේ තම ආධිපත්‍යය පැතිරවීම සඳහා එම රටවල ඇති සම්ප්‍රදයික ප්‍රභේද විනාශ කිරීමට ඔවුන් සෑම උත්සාහයක් ම දරනු ඇත. ඈත අතීතයේ ස්පාඤ්ඤ ආක්‍රමණිකයන් ඉන්කා ශිෂ්ඨාචාරය විනාශ කොට එවකට ඔවුන් ගේ ප්‍රධාන ආහාරය වූ ඇමරැන්ත් වගාව තහනම් කිරීමට පවා ක්‍රියා කළේ නම් වර්ථමානයේත් ඊට වඩා සූක්ෂම ලෙස සම්ප්‍රදයික බෝග විනාශ කිරීමට බීජ නිෂ්පාදනයේ යෙදෙන බහු ජාතික සමාගම් ඉදිරිපත් නොවේ යයි කිව හැක්කේ කා හට ද?

තාක්ෂණය අතින් සංවර්ධිත රටවලට වඩා ගව් ගණනක් පිටු පසින් සිටින්නා වූ තුන්වන ලෝකයේ රටවලට, බුද්ධිමය දේපල අයිතිය සඳහා ඉදිරිපත් වීමේ හැකියාව ඉතා අඩු අතර (නැති තරම් ය) මෙහි අවසන් ප්‍රතිඵලය වනුයේ බීජ සඳහා, දියුණු රටවල් කෙරෙහි නව නවත් රඳ පැවැත්මක් වීම පමණක් බවද සඳහන් කළ යුතුව ඇත.

එමෙන් ම, බීජ සහ ඒ සඳහා වන යෙදවුම් පිළිබඳ ඒකාධිකාරය තුළින් බහු ජාතික බීජ සමාගම් වලට එම නිෂ්පාදන වල මිල ගණන් තමනට රිසිසේ පාලනය කළ හැකි අතර එමගින් දියුණු වන රටවල ගොවි ජනතාවගේ දිවි පැවැත්මටත්, එම රටවල ආර්ථිකයට සහ දේශපාලනයටත්

11 පිටුවට ⇨

වගුව 1 : රජයේ ප්‍රධාන බිත්තර වී ගොවිපල වල නිෂ්පාදන හැකියාව, ගබඩා කිරීම සහ පැසවීමේ ධාරිතාවයන්.

| මධ්‍යස්ථානය | නිෂ්පාදන හැකියාව වසරකට (මෙට්‍රික් ටොන්) | ගබඩා (සංඛ්‍යාව) | ගබඩා පහසුකම් (මෙට්‍රික් ටොන්) | සැකසුම් (යන්ත්‍ර) | සැකසුම් ධාරිතාය පැයට (මෙට්‍රික් ටොන්) |
|---|---|---|---|---|---|
| අළුත්ගම | 420 | 06 | 600 | 02 | 1.2 |
| අම්බලන්තොට | 180 | 08 | 560 | 01 | 0.6 |
| බටඅත | 25 | 04 | 230 | 02 | 1.2 |
| හිඟුරක්ගොඩ | 1680 | 22 | 1900 | 02 | 1.6 |
| කන්තලේ | 280 | 04 | 540 | 03 | 1.8 |
| මහඉළුප්පල්ලම | 560 | 10 | 1000 | 03 | 1.8 |
| මල්වත්ත | 630 | 07 | 720 | 03 | 1.8 |
| මුරුන්කන් | 120 | 06 | 440 | 02 | 1.2 |
| තිකවැරටිය | - | 04 | 640 | 02 | 1.2 |
| පරන්තන් | 210 | 06 | 380 | 02 | 1.2 |
| පැල්වෙහෙර | 400 | 06 | 750 | 02 | 1.2 |
| පොළොන්නරුව | 700 | 07 | 520 | 03 | 1.8 |
| එකතුව | 5205 | 90 | 8280 | 27 | 16.6 |

**බීජ, බුද්ධිමය දේපල.....**
**10 පිටුවෙන්**

මහත් බලපෑමක් කිරීමටත් හැකි වනු ඇත.

එසේ ම වැඩි දියුණු කරන ලද බීජ හඳුන්වා දීම තුළින් ඒකීය බෝග රටාවකට තව තවත් නැඹුරු වීමත් එමගින් රටක කෘෂි කර්මාන්තය කෙරෙහි ඇතිවිය හැකි අයහපත් බලපෑම පිළිබඳ කරුණු අපට නො සලකා හැරිය නො හැකි ය. උදහරණ වශයෙන් මේ සියවස මුල දී ගොවීන් වගා කළ බෝග අතුරින් 75% පමණ ප්‍රමාණයක් වගාබිම් වලින් අතුරුදහන් වී ගොස් ඇත. අප දැනට ආහාර වශයෙන් භාවිතා කරන්නේ ශාබ ප්‍රභේද 150 ක් පමණ සංඛ්‍යාවකි. මෙවැනි තත්ත්වයන් තුළ නව ප්‍රභේද හඳුන්වා දීම තුලින් තව දුරටත් සම්ප්‍රදායික භෝග සහ ඒවායේ ප්‍රභේදයන් කොන් වීමත්, සමස්ථයක් වශයෙන් ජාන කිටුව (Gene pool) ක්ෂය වීමත් නො වැලැක්විය හැකි ය. ආහාර ශාබ ප්‍රභේදයන් ගේ විවිධත්වය (Plant diversity) හීන වීම රටක ආහාර සුරක්ෂිතභාවයට (Food Security) එල්ල විය හැකි මරු පහරකි.

වැඩි අස්වනු නව ප්‍රභේද හඳුන්වාදීම තුළින්, සම්ප්‍රදායික වගා රටාවේ ඇතිවන වෙනස් කම් ද, ඒ හා බැඳුණු සම්ප්‍රදායික වගා දැනුම වැලලී යාම ද ඛේදජනකය.

* * * * * *

ආහාර ශාබ වර්ග ලොව පුරා ඒකාකාරී ව පැතිරී නොමැති අතර, සමුදුරු, කඳු වැටි වැනි භූගෝලීය සීමාවන්ගෙන් වෙන්වුනු මධ්‍යස්ථාන අටක සම්භවය ලබා ඇතැයි විශ්වාස කෙරේ. ඒවා වැඩි වශයෙන් පැතිර ඇත්තේ දැනට දියුණු වෙමින් පවත්නා රටවල භූමි භාගයන් තුල ය. එම ශාබ බොහොමයක් වසර දහස් ගණනක් මුළුල්ලේ ගොවීන් අතින් ප්‍රයෝජනවත් ශාබ බවට පරිණාමය විය. මුල් ශාබ තුල විසිරී තිබූ ප්‍රයෝජනවත් ලක්ෂණ ඒක රාශි කොට මනා ප්‍රවේණි දර්ශණයන් (Genotypes) බවට පෙරලීමේ මූලික අයිතියත්, ගෞරවයත් හිමි විය යුත්තේ මෙම රටවල ගොවීන්ට ය. දේශටනයේ යෙදුනු වෙළෙඳුන් අතින් මෙ ශාබ ලොව පුරා ව්‍යාප්ත විය. එසේ ගෙන ගිය පැලැටි ජාන සම්පත් සඳහා කිසියම් වන්දියක් ගෙවීම කිසි විටෙකත් නො කරණ ලදී. එසේ ම පැලැටි අභිජනකයෝ තම පර්යේෂණ කටයුතු සඳහා අමුද්‍රව්‍ය වශයෙන් උපයෝගී කර ගන්නා තුන්වන ලෝකයේ රටවල සම්ප්‍රදායික බෝග සඳහා කිසිම වන්දියක් නො ගෙවති.

බහු ජාතික සමාගම් වලත්, සංවර්ධිත රටවලත් මූඛ්‍ය අරමුණ වී ඇත්තේ දුරතීතයේ සිට මිනිසා විසින් පොදුවේ පරිහරණය කළ ශාබ සහ සත්ත්ව ප්‍රභේද වල තනි හිමිකරුවන් වී හැකි තරම් මුදල් ඉපැයීම ය.

දිළිඳු රටවල තෙල්, ගල් අඟුරු සහ ලෝහ වැනි වෙනත් අමුද්‍රව්‍ය සූරා කෑම මේ දක්වා සිදු වුන ද ඒ සඳහා යම් ගෙවීමක් (බොහෝ විට සාධාරණ නො වුව ද) සිදු කෙරේ.

එනමුදු අප ශාබ සහ සත්ත්ව සම්පත් සඳහා නියි වන්දියක් ගෙවීමට බටහිර රටවල් පෙළෙඹෙන බවක් දක්නට නැත.

එබැවින් බීජ ඇතුලු ශාබ සහ සත්ත්ව සම්පත් පෞද්ගලික අයිතියට පැවරීම සහ අප රටවල ජාන සම්පත් මංකොල්ල කෑමට එරෙහිව ජනතාව දැනුවත් කිරීමටත්, අපගේ සම්ප්‍රදායික බෝග සහ තාක්ෂණ ඥාණය පිළිබඳ නියි තක්සේරුවක් කිරීමටත් ජනතා සහභාගීත්වය ඇතිව ඒවා සංරක්ෂණය කිරීමටත් දැන් කාලය එළඹ ඇත.